## ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය - 2015

---

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000-1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### **1.4** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන
-----------------

**2.1** තත්ත්වාගණනය කළ මතය
-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති
------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජිවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.114,130,385 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රසායන ද්‍රව්‍ය හා වීදුරු උපකරණ මිලදී ගැනීම් සඳහා දරනු ලබන වියදම අදාල වර්ෂයේ වියදමක් ලෙස ලියා හැරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.12,231,211 ක්වූ ඉතිරි තොගය ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වෙනුවෙන් ගෙවූ රු.539,200 ක නීති වියදම් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්
----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භෞතිකව සත්‍යාක්ෂණය කරන ලද තොග ශේෂය හා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ තොග ශේෂය අතර රු.677,355 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ගිවිසුම් කඩකළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ සම්බන්ධයෙන් ලබාගත් ශේෂ සනාථ කිරීම් හා මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂයන් අතර රු.719,287 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) පර්යේෂණ කටයුතු සඳහා විවිධ පුද්ගලයන්ගෙන් ලැබුණු මූල්‍ය ප්‍රදානවල වටිනාකම රු.1,436,341 ක් බව විශ්වවිද්‍යාලය විසින් තහවුරු කර තිබුණද මූල්‍ය ප්‍රකාශනවල රු.1,131,952 ක් ලෙස දක්වා තිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු.3,531,671 ක් වටිනා පහත සඳහන් ගිණුම් විෂයයන් 03ක් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ආපසු ගෙවියයුතු තැන්පත් | 2,009,692 | කේවල ශේෂ ලැයිස්තු |
| ආරක්ෂක තැන්පත් | 879,553 | කේවල ශේෂ ලැයිස්තු |
| පොදු තැන්පත් - පුනරාවර්තන | 642,426 | තැන්පත් ලේඛන හා ශේෂ ලැයිස්තු |
| එකතුව | 3,531,671 | |

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 ජුලි 28 දින විශ්වවිද්‍යාලයට උපකුලපති ලෙස පැමිණි මහාචාර්යවරයාට 2011 ජනවාරි සිට ජුලි දක්වා වූ කාලයට අදාලව ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ගෙවා තිබුණු රු.93,546 ක පර්යේෂණ දීමනා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් අයකරගෙන නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් විස්තරයේ ඇතුළත් 2013 හා 2014 වර්ෂවලට අදාල රු.38,000 ක බැංකු වැරදි හර කිරීම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බැඳුම්කර හා ගිවිසුම් කොන්ත්‍රාත් කඩකිරීම සම්බන්ධයෙන් ආචාර්යවරු දෙදෙනෙකුගෙන් රු.8,440,058 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතුව තිබුණි.

(ඈ) 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු ඉටුකළ මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට **(CECB)** ගෙවිය යුතු රු.60,768,008 ක් 2015 දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ | |

| | |
|---|---|
| 14 (1) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 37(1) වගන්තිය | නියමාවලි මගින් සංයුතිය නියම කළ තෝරා ගැනීමේ කමිටුවක නිර්දේශය මත පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරිවරයා පත් කළයුතු නමුත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොමැතිව 2014 නොවැම්බර් 12 දින සිට උපකුලපතිවරයා විසින් කාර්ය පැවරුම් පදනම මත විශ්‍රාමික නිලධාරියෙකු ලේඛකාධිකාරී වශයෙන් පත්කර 2015 දෙසැම්බර් 31 දිනට රු.1,645,000 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| **(i)** මුදල් රෙගුලාසි 139 | සහතික කිරීමේ නිලධාරියා විසින් සහතික කරන ලද වවුචර්වලට පමණක් ගෙවීම් කළ යුතු වුවද, ඊට පටහැනිව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට සමාලෝචිත වර්ෂයේදී රු.2,814,378 ක මුදලක් ගෙවා තිබුණි. |
| **(ii)** මුදල් රෙගුලාසි 156 | සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මැයි දක්වා කාලපරිච්ඡේදය තුළදී සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව දායක මුදල් නිසි වේලාවට නොගෙවීම නිසා රු.70,347 ක අධිභාර මුදලක් ගෙවීමට සිදු වී තිබුණු අතර එම මුදල ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(iii)** මුදල් රෙගුලාසි 371 (2) | නිලධාරීන් 04 දෙනෙකු විසින් ලබාගත් රු.234,912 ක අත්තිකාරම් එම කාර්යය නිමකළ වහාම පියවීමට කටයුතු නොකර ඒ සඳහා මාස 01 සිට මාස 10 දක්වාවූ කාලයක් ලබාගෙන තිබුණි. |
| (ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 හා 2002 නොවැම්බර් 28 දිනැති අංක **IAI/2002/02** දරන භාණ්ඩාගාර චක්‍රලේඛ | පිරිවැය රු.2,139,950,371 ක දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් විධිමත් පරිදි වත්කම් පන්ති අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර පිරිවැය රු.32,850,376 ක පරිගණක මෘදුකාංග හා දෘඩාංග සම්බන්ධයෙන් වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) 2003 ජුනි 03 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.1 හා 7.2 ඡේදය | විශ්වවිද්‍යාල ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 2013 අගෝස්තු 29 දිනැති අංක 12/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ආයතනික චක්‍රලේඛය | පොෂ්‍ය නිලධාරීන්ට හිමි නිවාසවල හා තනිකඩ බද්ධ නිවාසවල පදිංචි නිලධාරීන්ගෙන් නිවාස කුලී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.97,665,336 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.59,812,116 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.37,853,220 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු ප්‍රතිපාදනය රු.16,669,000 කින් වැඩි වුවද, සේවක පාරිශ්‍රමික රු.54,213,376 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී දායකත්වය වැඩි වී තිබුණු අතර 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී දායකත්වය අඩු වී තිබුණි. කෙසේ වුවද 2013 වර්ෂයේදී රු.113,423,662 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.254,823,688 ක් දක්වා වර්ධනය වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ දී රජයේ ප්‍රදාන හා විලම්භිත ආදායම් හැර ආදායම් සියයට 12 කින්ද ක්ෂයවීම් හැර වියදම් හා ඌනතාවය සියයට 17 කින්ද රජයේ ප්‍රදාන සියයට 5 කින්ද වැඩිවී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් සියයට 120 කින් වර්ධනය වී තිබූ අතර කාරක ප්‍රාග්ධනය සියයට 55 කින් අඩු වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී ජංගම වගකීම්වලට ජංගම වත්කම් 3:1 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ජංගම වත්කම්වල සිදුවූ ඉහලයාම හේතු කොට ගෙන, ජංගම වගකීම්වලට ජංගම වත්කම් 1.4:1 ක් වී ජංගම අනුපාතයේ 1.6 ක වර්ධනයක් පෙන්නුම් කළද එය ප්‍රශස්ථ මට්ටම වූ ජංගම වගකීම්වලට ජංගම වත්කම් 1:2 මට්ටමට ළඟාවී නොතිබුණි .

(ඈ) 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය සියයට 23 කින් අඩුවී තිබූ අතර ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහ පිළිවෙලින් සියයට 11 හා සියයට 18 කින් වර්ධනය වී තිබුණි. වර්ෂය අවසානයේ මුදල් හා සමාන දෑ වල සියයට 325 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

4.1 කාර්යසාධනය
-----------------

විශ්වවිද්‍යාලය විසින් 2015 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ළඟාකර ගැනීමට අපේක්ෂිත උපායමාර්ගික ඉලක්ක 14 ක් සඳහන් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව වූ උපායමාර්ගික ඉලක්ක 2015 වර්ෂය අවසාන වන විට අපේක්ෂිත තත්ත්වයට ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලෝකයේ ඉල්ලුමට සරිලන පරිදි සුදුසුකම් හා සමාජ අගයන් වැඩි දියුණු කිරීම හා වෙනස් වන කාර්මික අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස සියළු උපාධි පාඨමාලාවල විෂයමාලාවන් සංශෝධනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීම තුලින් උපාධිධාරීන්ගේ සේවා නියුක්ති ප්‍රතිශතය සියයට 80 මට්ටමට ලඟාකර ගැනීම අපේක්ෂා කර තිබුණු නමුත් 2015 වර්ෂයේ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ උපාධිධාරීන්ගේ සේවා නියුක්ති ප්‍රතිශතය සියයට 73 ක් දක්වා පහළ බැස තිබුණි.

(ආ) විද්‍යාව, තාක්ෂණය, කෘෂිකර්මය හා කළමනාකරණ උසස් අධ්‍යාපනය සඳහා විදේශ සිසුන්ගේ සහභාගිත්වය යන අරමුණ ඉටුකර ගැනීම තුලින් විශ්වවිද්‍යාලයේ අපේක්ෂිත විදේශීය ශිෂ්‍ය ලියාපදිංචිය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 1 ක් වුවත් 2015 වර්ෂයේ ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 0.54 ක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට ලෝක ඉල්ලුමට සරිලන පරිදි උපාධි පාඨමාලාවල ශික්ෂණය වර්ධනය කිරීම, පර්යේෂණ හා ඉගැන්වීම්වල තත්ත්වයන් වැඩි දියුණු කිරීම හා ඉගැන්වීමට, ඉගෙන ගැනීමට හා පර්යේෂණ සඳහා වඩා උසස් යටිතල පහසුකම් ඇති කිරීම යන අරමුණු ඉටුකර ගැනීම තුලින් විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීමේ ලැයිස්තුවේ (Web of Universities Ranking) මුල් 13000 අතරට පැමිණීම අපේක්ෂා කර තිබුණු නමුත් 2016 මැයි 31 දිනට ඉකුත් වර්ෂයට සාපේක්ෂව එම ස්ථානය 14236 සිට 15362 දක්වා ස්ථාන 1126 කින් හා දේශීය ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවේ 2013, 2014 හා 2015 වර්ෂවල ස්ථානය පිළිවෙලින් 17,19 හා 20 වන ස්ථානය දක්වා පහළ බැස තිබුණි.

(ඈ) දැනුම් සහ තොරතුරු අවශ්‍යතා සඳහා විශ්වවිද්‍යාලයේ පුස්තකාල පහසුකම් ව්‍යාප්ත කිරීම හා වැඩි දියුණු කිරීමේ අරමුණ අනුව ශිෂ්‍යයන්ගේ හා කාර්ය මණ්ඩලයේ පුස්තකාලය භාවිතයේ අපේක්ෂිත අගය සියයට 60 ක් වුවත් එය 2015 වර්ෂය අවසානයේදී සියයට 46.5 ක අගයක් ගෙන තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ පිළිවෙලින් ශිෂ්‍යයින් 1956 ක් හා 1900 දෙනෙකු වෙනුවෙන් රු.534,096,538 ක් හා රු.457,802,863 ක පුනරාවර්තන වියදම් දැරීම නිසා ඒක ශිෂ්‍ය පිරිවැය රු.273,055 ක් හා රු.240,949 ක් විය.මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.32,106 කින් වැඩිවී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයට බඳවාගත් සිසුන් 550 දෙනෙකුගෙන් සිසුන් 09 දෙනෙකු එනම් සියයට 1.6 ක් පාඨමාලා හැර ගොස් තිබුණි.

(උ) 2013-2017 සංයුක්ත සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය සඳහා උපාධි පාඨමාලා 11 කට සිසුන් 850 දෙනෙකු බඳවාගත යුතු වුවත් සිසුන් 550 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි. ඒ අනුව අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 300 ක් ලියාපදිංචි වී නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 පෙබරවාරි 10 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක: 5/0183/035/001 යටතේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ඉඩම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාලව ගත් තීරණය අනුව විශ්වවිද්‍යාලයට වෙන්කර තිබුණු හෙක්ටයාර් 30.9667ක ඉඩම්වල අයිතිය විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව පවරා ගෙන නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව විගණන විමසීම් පිළිබඳව අප්‍රමාදව ක්‍රියාකොට ඒවාට සම්පූර්ණ පිළිතුරු සැපයීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වන නමුත් රාජ්‍ය විගණනය විසින් 2015 වර්ෂයේ නිකුත් කළ විමසුම් 05 කට 2016 මැයි 31 දින වනවිටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

4.3 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ දිරිමත් කිරීම සඳහා 2015 වර්ෂයේදී රු.6,650,000 ක අයවැයගත මූලධන ප්‍රතිපාදනයෙන් රු.1,480,495 ක් උපයෝජනය කර තිබීමෙන් රු.5,169,505 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 78 ක් විය.

(ආ) උසස් පෙළ නව තාක්ෂණ විෂය ධාරාවට ගැලපෙන පරිදි තාක්ෂණ උපාධි පාඨමාලාවක් ස්ථාපිත කිරීම සඳහා 2015 වර්ෂයේ රු.25,000,000 ක අයවැයගත මූලධන ප්‍රතිපාදන වෙන්වී තිබුණද රු.745,162 ක් උපයෝජනය කර තිබීමෙන් රු.24,254,838 ක් එනම් වෙන්වූ ප්‍රතිපාදනයෙන් සියයට 97 ක් උපයෝජනය කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා 2014 දෙසැම්බර් මාසයේ විශ්වවිද්‍යාලයට ලබාදී තිබූ රු.3,323,020 ක මුදල 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිශ්කාර්යව තිබුණු බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සතුටුදායක ප්‍රගතියක් නොතිබුණි.

(ඈ) 2014 හා 2015 වර්ෂවල බාහිර පාඨමාලා වලින් ඉපයූ ආදායමෙන් රු. 2,000,000 ක පමණ මුදලක් පාඨමාලා ආරම්භ කිරීමේ කටයුතුවලට යෙදවීමකින් තොරව ජංගම ගිණුමක තැන්පත් කර තිබුණි.

4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 ජුනි 30 දින මිලදීගත් රු.322,560 ක සේප්පු 05 ක් 2015 දෙසැම්බර් 31 දිනටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී ඉංජිනේරු වැඩපල සඳහා මිලදී ගත් විවිධ කාර්යයන් සඳහා භාවිතා කළ හැකි රු.14,060,480 ක් වටිනා 3-**Axis CNC** යන්ත්‍රය භාවිතා කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වාර්තා අනුව 2015 දෙසැම්බර් 31 දිනට දැව භාවිතයෙන් සිදුකළ ප්‍රදර්ශනාත්මක කාර්යයන්ට පමණක් භාවිතා කිරීමෙන් මෙම යන්ත්‍රය ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ මූල්‍ය අංශයේ පරිපාලන කටයුතු පහසුකර ගැනීමට 2013 වර්ෂයේ මිලදී ගත් රු.222,768 ක් වටිනා ගිණුම්කරණ මෘදුකාංගය ප්‍රයෝජනයට නොගෙන භාවිතයෙන් ඉවත් කර තිබුණි.

4.5 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------

ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනයේ අංක 08 හා 2006 ජනවාරි 25 දිනැති උපදෙස් සංග්‍රහයේ හා **ICTAD SBD/01** ඡේද 33.6 අනුව ඉදිකිරීම් පිරිනැමීමෙන් පසුව සේවාදායක ආයතනය හා කොන්ත්‍රාත්කරු අතර ලිඛිත ගිවිසුමක් ඇතිකරගත යුතු වුවත් විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම්, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට **(CECB)** ලබාදීමේදී ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

විශ්වවිද්‍යාලයේ පීඨයන්හි අනුමත මහාචාර්ය තනතුරු 10 ක් හා සත්ත්ව විද්‍යාව හා අපනයන කෘෂිකර්ම පීඨය සහ විද්‍යා හා තාක්ෂණ පීඨය සඳහා අනුමත කථිකාචාර්ය තනතුරු 180 න් 40 ක පුරප්පාඩු පැවති අතර කළමනාකරණ පීඨයේ කථිකාචාර්යවරු 07 ක අතිරික්තයක් පැවතුණි. තවද 2006 ජුනි 06 දිනැති අංක 876 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 70 කට නිලධාරීන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

5.1 සංයුක්ත සැලැස්ම

--------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් යථෝක්ත සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණු අතර ඉටුකරගත යුතු ඉලක්කයන්ගේ මූල්‍ය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර හා අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචිත වර්ෂයට පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්ව නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

---------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 (2) ප්‍රකාරව විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකරන ලද්දේද යන්න තහවුරු කර ගැනීමට මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.4 ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ) හා 4.2.2 ඡේද ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

ඇස්තමේන්තුගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී පුනරාවර්තන වැය විෂයයන් 05 කට වෙන්කළ ප්‍රතිපාදන වලින් සියයට 4 සිට සියයට 66 දක්වා වූ විචලනයන් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 09 කට වෙන්කළ ප්‍රතිපාදනවලින් සියයට 15 සිට සියයට 97 දක්වා වූ සැලකිය යුතු විචලනයන්

නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.6 නොවිසඳී ඇති විගණන ඡේද
--------------------------------

2012 සැප්තැම්බර් 21 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් උපදෙස් අනුව අප ජලය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විශ්වවිද්‍යාලය අපොහොසත්ව තිබුණි.

6. පද්ධති හා පාලනයන්
------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත වරින්වර දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම, ගිණුම්කරණ අඩුපාඩු හා නොසැසඳුනු ගිණුම් පැවතීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම, ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| (ඇ) | ගබඩා පාලනය | දුර්වල තොග කළමනාකරණය, තොග මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් නොකිරීම |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | තනතුරුවල පුරප්පාඩු පැවතීම හා අතිරික්ත සේවකයින් සිටීම. |
| (ඉ) | කාර්යසාධනය | අපේක්ෂිත අරමුණු කරා ළඟා නොවීම |
| (ඊ) | අයවැය ලේඛනමය පාලනය | ඇස්තමේන්තු හා සත්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් පැවතීම |